# දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය

# ඇබෑර්තු

කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය විසින් පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකාවේ අපේක්ෂකයන් වෙතින් 2021 මාර්තු 15 වෙනි දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. තාක්ෂණ නිලධාරී තනතුර (ICT) III වන ශ්‍රේණිය (ඇබෑර්තු 02 යි)

**සුදුසුකම් :**

(i) ඕනෑම ධාරාවකින් එක් වාරයකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී විෂයන් තුනකින් (03) සමත්ව තිබීම

**සහ**

(ii) තොරතුරු සන්නිවේදන හා බහුමාධ්‍ය තාක්ෂණය / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය / තොරතුරු තාක්ෂණ හා සමාන ක්ෂේත්‍රයක තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 5 වන (NVQ Level 05) මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම.

තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳව පළපුරුද්දක් සහිත අයවලුන්ට විශේෂත්වයක් දක්වනු ලැබේ.

## 02. තාක්ෂණ නිලධාරී තනතුර (ශ්‍රව්‍ය දෘෂ්‍ය) III වන ශ්‍රේණිය (ඇබෑර්තු 01 යි)

**සුදුසුකම් :**

(i) ඕනෑම ධාරාවකින් එක් වාරයකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී විෂයන් තුනකින් (03) සමත්ව තිබීම

**සහ**

(ii) (අ) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හෝ පාර්ලිමේන්තුව විසින් පනතක් සම්මත කිරීම මගින් පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයක් විසින් පිළිගනු ලබන ආයතනයක් විසින් ඉලෙක්ට්‍රෝනික හා සන්නිවේදන / ඉලෙක්ට්‍රෝනික විද්‍යාව / බහුමාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් 5 වන (NVQ Level 05) මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම

**හෝ**

(ආ) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ඉහත (ii) (අ) සඳහන් සුදුසුකමට සමාන යයි පිළිගනු ලබන ඉලෙක්ට්‍රෝනික හා සන්නිවේදන / ඉලෙක්ට්‍රෝනික විද්‍යාව / බහු මාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණ ක්ෂේත්‍රයේ තාක්ෂණික සුදුසුකම් ලබාගැනීමෙන් පසුව පිළිගත් ආයතනයක ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩ පිළිබඳව වසරක පළපුරුද්දක් ලබා තිබීම.

➢ **තෝරාගනු ලබන ක්‍රමය :** ලිඛිත සහ / හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්.

➢ වැටුප් පරිමාණය : 2020.01.01 දිනට රු. 31,625 - 7 x 300; 10 x 355 - 37,275 (මාසිකව) U-MT 1(IIIA)

➢ **වයස් සීමාව :** වයස අවුරුදු 18 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 45 ට වැඩි නොවිය යුතුය.

ඉහත වැටුපට අමතරව, ජීවන වියදම් දීමනාව සහ අනෙකුත් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.

**අනෙකුත් ප්‍රතිලාභ**

➢ විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදල : සේවා යෝජකයා විසින් විශ්වවිද්‍යාල අර්ධ සාධක අරමුදල සඳහා මාසික මූලික වැටුපෙන් 7% කට සමාන මුදලක දයකත්වයක් ලබා දෙන අතර, විශ්වවිද්‍යාල අර්ධ සාධක අරමුදල සඳහා සේවකයා විසින් මාසික මූලික වැටුපෙන් 10% කට සමාන මුදලක දයකත්වයක් ලබා දිය යුතුය.

➢ විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය : විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා සේවා යෝජකයාගේ දයකත්වය මාසික මූලික වැටුපෙන් 10% ට සමාන මුදලක්

➢ සේවක භාරකාර අරමුදල : සේවක භාරකාර අරමුදල සඳහා සේවා යෝජකයාගේ දයකත්වය මාසික මූලික වැටුපෙන් 3% ට සමාන මුදලක්

**වැදගත්**

➢ උසස් අධ්‍යාපන ආයතන / රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් යොමු කළ යුතුය.

➢ අදාළ සුදුසුකම් සහතිකවල පිටපත් අයදුම්පතට අමුණා ඉදිරිපත් කළ යුතුය.

➢ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්, නියමිත ආකෘතිය ප්‍රකාරව ඉදිරිපත් නොකළ අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

➢ ආයතනයේ www.iim.cmb.ac.lk යන වෙබ් අඩවියෙන් අයදුම්පත භාගත කරගත හැකිය.

➢ නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත්, 2021.03.15 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි **"සහකාර ලේඛකාධිකාරී / ආයතන, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය, රාජගිරිය"** යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවීමට හෝ අයදුම්පතේ මෘදු පිටපතක් (PDF සහ WORD පිටපත්) recruit@iim.cmb.ac.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට එවිය යුතුය.

➢ අයදුම්කරන තනතුර අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ,**
**දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය,**
**කොළඹ විශ්වවිද්‍යාලය, රාජගිරිය.**
**2021.02.15**